// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2118/74 – 2019 අප්‍රේල් 12 වැනි සිකුරාදා – 2019.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2013 අප්‍රේල් මස 26 වැනි දින අංක 1807/22 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 113 හා 2013.04.22 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත I වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/UDA/322.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: මහ/ඉ/අත්/336.
2019 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**I වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 496බී - කොට්ටාව නගරය සහ අංක 498ජී - මාකුඹුර උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, කොට්ටාව, මාකුඹුර සහ මාලපල්ල ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො. 9375 හා 2018.10.28 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 100 – මාකුඹුර හෝකන්දර පාරේ වරි. අංක 102 (කොටසක්) – ප්‍රමාණය: හෙක්. 0.0023ක් පමණ**

උතුරට: කැබලි අංක 36, මාකුඹුර හෝකන්දර පාරේ වරි. අංක 106 සහ 102 දරන ඉඩම්; නැගෙනහිරට: මාකුඹුර හෝකන්දර පාරේ වරි. අංක 102 දරන ඉඩම; දකුණට: මායා පටුමග, කැබලි අංක 38 සහ 101; බටහිරට: කැබලි අංක 101.

04 - 1067

1A – G29884– 26 (2019/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*